# ජන කවියෙන් නිරූපිත ශ්‍රී ලාංකේය සම්ප්‍රදායික සමාජයීය කාන්තාව පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

කුමාරි ඩබ්ලිව්.අයි.ජේ.එම්.ආර්.එන්. සහ ප්‍රසාද් එම්.ඒ.පී.

සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
rasikanilmini94@gmail.com

**සාරසංක්ෂේපය**

ස්ත්‍රිය යනු ජීවයේ උල්පතයි. ස්ත්‍රියගෙන් තොරව මානව වර්ගයාට පැවැත්මක් නොවේ. මෙලොවට මානව වර්ගයා දායාද කරන්නාවූ ඇය උත්තරීතර මාතෘත්වයෙන් පිදුම් ලබයි. කාන්තාව සමාජ පර්යාය තුළ විවිධ වූ භූමිකා රාශියක නිරතවන තැනැත්තියකි. ඒ අනුව මෙම උත්තරීතර කාන්තාව පිළිබඳ කරුණු රැසක් ගැමි ජන කවිවලින් හෙළි වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ජන කවිය, ශ්‍රී ලාංකේය සම්ප්‍රදායික සමාජයේ වාසය කළ කාන්තාව කෙබඳු ස්වරූපයකින් නිරූපණය කර ඇත්දැයි යන්න විමර්ශනය කිරීමයි. මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්‍රමවේදය ලෙස ද්විතීයික මූලාශ්‍ර භාවිතය ප්‍රධාන වශයෙන් සිදු විය. ශ්‍රී ලංකාවේ පුරාතන ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවගේ ගුණ දොස් සහ වටිනාකම් වර්ණනාවට බඳුන් විය. එහිදී ජන කවියෙන් හෙළිවූ කාන්තාවගේ සොම්නස, දොම්නස, වියෝග සහ ප්‍රයෝග සිදුවීම් ගණනය කළ නොහැකි තරම්ය. මුළු විශ්වයෙහි ම 'අම්මා' යන වදනට සම කළ හැකි කිසිවෙකු නොමැති අතර ඇය පිළිබඳව උපදේශනයන්ද අතීත සමාජයෙහි නිර්මාණය විය. 'සිහිවෙයි පෙර කලේ අම්මා කරපු ආලේ' මවක නිරතුරුව තම දරුවනගේ කුස පුරවන්නට වෙහෙස වූ අතර මව්වරුන් වියෝ වූ පසු දරුවන් තම මව්වරු මනසින් මවාගෙන කම්පා විය. වත්මන් සමාජයේ මෙන්ම අතීත සමාජයේද තම මතය යටපත් කරගෙන දෙමව්පියන්ගේ අණසකට පිටු නොපා කටයුතු කළ දියණිවරුන් වූ නමුත් ඔවුන් ඉඩකඩ ලද සැනින් එකී කීකරුකමින් මිදී කටයුතු කර ඇත. 'ඊයේ පළවිච්චියි මා ළඟ හිටපු එකී' කාන්තාවන් තම පතිවත, පාරිශුද්ධත්වය රැක ගැනීමට යුහසුළුව කටයුතු කර ඇති අතර ඔවුන් කිසිම විටෙක ධනය, බලය ඉදිරියේ නියාලු නොවුණු මනා හික්මීමෙන් යුතු තැනැත්තියන් විය. 'කෙල්ලක් ඉදන් දොර නාරී ඇගෙ නපුරු' එමෙන්ම කාන්තාව 'රන් කඳ, මැණික' යනාදී ලෙස හැඳින්වීම සහ ගැහැනිය 'පත්තිනි මෑණි' කොට සැළකීමත් ඇයට හිමිව තිබූ සුවිශාල ගරුත්වයකි. 'පෙනේ මවක ලෙස පත්තිනි අම්මා' එකල කාන්තාව ආත්මාර්ථකාමී සිතුවිලි පරදා තම කුටුම්භය කෙරෙහිද පැහැදී ක්‍රියා කළ බවත් ජන කවිය තුළින් නිරූපණය කර ඇත. 'හඳ පායාගෙන එනකොට ඉඳ ගත්තා' අතීත ශ්‍රී ලාංකේය සමාජය තුළ කාන්තාව හුදෙකලාවූ තැනැත්තියක නොවූ අතර සෑම සමාජමය ක්‍රියාවකදීම ඇයව උසස් කොට සැළකීය. 'ජාතික සංස්කෘතියේ කැඩපත බඳු' ජන කවිය තුළින් ශ්‍රී ලාංකේය සම්ප්‍රදායික සමාජයෙහි වාසය කළ කාන්තාව අව්‍යාජත්වයෙන් සහ ඉතා සරලව නිරූපණය කර ඇති බව අවධාරණය කරගත හැකි විය.

**ප්‍රමුඛ පද:** *ආත්මාර්ථකාමී, කුටුම්භය, පුරාතන, මානව, සමාජ පර්යාය*